# 23 මරිය බැතිය

මරියෝත්තමාවන් තරම් කතෝලිකයින්ගේ ගෞරවාදරයට පාත්‍ර වූ වෙනත් කිසිදු කාන්තාවක් මෙතෙක් බිහිවී නැත. එසේ බිහිවන්නේ ද නැත. එතුමිය වෙනුවෙන් බිහිවී ඇති යැදුම්, පොත්-පත්, භක්ති ගී, මූර්ති, සිතුවම්, නාම, ආමන්ත්‍රණ, විරුදාවලි, සිද්ධස්ථාන හා දෙව්මැදුරු එයට සාක්ෂියකි. මෙයින් පෙන්නුම් කරන්නේ කතෝලික ජනවන්දනාව සහ භක්ති අභ්‍යාසයන් තුළ මරියෝත්තමාවන්ට හිමි වන සුවිශේෂ ස්ථානය බව අමුතුවෙන් කිව යුතු නැත.

පළමු ශතවර්ෂ තුන තුළ රෝම අධිරාජ්‍යයන් විසින් කිතුනුවන් මරා දමනු ලැබිණි. එබැවින් එම ශතවර්ෂවල දී ශුද්ධ වූ සභාවේ අවධානය යොමු වූයේ ප්‍රාණපරිත්‍යාගිවරුන් පිළිබඳ ව ය. එහෙත් එවැනි පසුබිමක් තුළ පවා මරිය තුමිය පිළිබඳ ව විශේෂ අවධානයක් යොමු වූ බවට තෙවන ශතවර්ෂයෙන් සාක්ෂියක් ඇත. එම සාක්ෂිය නම් අප හොඳින් කට පාඩමින් දන්නා "ස්වාමි දරුවන්ගේ සුවිශුද්ධ මෑණියනි" යන යැදුම යි. මෙම යැදුම ක්‍රිස්තු වර්ෂ තෙවන ශතවර්ෂයේ සිට පැවත එන්නකි.

> ස්වාමි දරුවන්ගේ සුවිශුද්ධ වූ මෑණියනි, අපි ඔබගේ සරණය සොයමින් එමු. මහිමෝත්තම වූ ද, අශිර්වාද ලද්ද වූ ද කන්‍යා වෙනි, අපේ ඕනෑකම්වල දී අපි කරන යාච්ඤා ඔබ ප්‍රතික්ෂේප නොකර සියලු අන්තරාවලින් නිතර ම අප ගලවා ගත මැනව
> - ආමෙන්

## මරිය බැතියේ දේව ධාර්මික පසුබිම

> හැම පරපුරක් ම මෙතැන් සිට "භාග්‍යවන්තිය" යි මට කියනු ඇතැයි මරිය තුමිය එළිසබෙත් තුමියට පැවසුවා ය. මරිය බැතියෙන් මෙය සැබෑවක් වී ඇත. එහෙත් මරිය බැතියේ දී සිදු වන්නේ මරිය තුමියට වන්දනා කිරීම නොව ගෞරව කිරීම යි. කිතුනු අපගේ වන්දනාව හිමි වන්නේ පියාණන් වහන්සේට, පුත්‍රයාණන් වහන්සේට හා ශුද්ධාත්මයාණන් වහන්සේට පමණි (1 තිමති 2:5-6).
>
> (කතෝලික සභා ධර්මෝපදේශය 971)

මරිය තුමියට අප ගෞරව කරන්නේ පහත සඳහන් හේතු නිසා යː

1. එතුමිය දේව පුත්‍රයාගේ මාතාව වීම
2. ජම්ම පාපයෙන් නිර්දෝෂ ව පිළිසිඳ ගැනීම
3. මවක් වූවත් දරු ප්‍රසූතියට පෙර හා පසු කන්‍යාභාවය ආරක්ෂා කර ගැනීම
4. දේව වරප්‍රසාදයෙන් පූර්ණ වීම
5. සකල පාපයෙන් නිදෙස් වීම
6. ආත්ම ශරීර පිටින් සුරලොවට වැඩීම

## ජම්ම දෝෂයෙන් නිර්දෝෂ ව පිළිසිඳ ගැනීම

මරිය තුමිය සිය මවගේ කුසයෙහි පිළිසිඳ ගත් පළමු මොහොතේ සිට ම විශේෂ දේව වරමින්, ජන්ම පාප කිළුටෙන් නිදෙස් වූවා ය. ඒ පිළිබඳ ව අතිඋතුම් නව වන පියුස් ශුද්ධෝත්තම පියතුමා ප්‍රකාශයට පත් කළේ යː

> භාග්‍යවත් කන්‍ය මරියෝත්තමාවන් පිළිසිඳගත් පළමු මොහොතේ සිට සර්ව බලධාරි දෙවියන් වහන්සේ ලබා දුන්නා වූ සුවිශේෂ වූ දේව වරප්‍රසාදයකින් හා මුළු මනුෂ්‍ය සංහතියේ ම මිදුම්කරුවාණන් වූ ක්‍රිස්තුන් වහන්සේගේ කුසල් හේතුවෙන් ජම්ම පාපයේ සියලු කිළුටෙන් සුරක්ෂිත කරනු ලැබිණි.
>
> (කතෝලික සභා ධර්මෝපදේශය 491)

ඒ අනුව මරියෝත්තමාවන් දේව පුත්‍රයාණන් වහන්සේගේ මව වීමට තෝරා ගන්නා ලද නිසා දෙවියන් වහන්සේගේ අතිවිශේෂ කැඳවීම තුළ පිළිසිඳ ගැනීමේ දී දේව වරමින් එතුමිය ව ජම්ම පාපයෙන් නිදෙස් කරනු ලැබිණි. මරිය තුමිය ජම්ම දෝෂයෙන් නිදෙස් කළා සේ අප ව ද ප්‍රසාද ස්නාපනයේ දී ජම්ම පාපයෙන් නිදහස් කර ඇත. එතුමිය ජම්ම පාපයෙන් නිදෙස් වූවා පමණක් නොව සියලු කර්ම පාපවලින් ද වැළකී සිටියා ය. ප්‍රසාද ස්නාපනය ලැබූ අපි එබැවින් සියලු පාපවලින් වැලකී යහපත් ජීවිතයක් ගත කළ යුතු වෙමු.

## මරිය තුමියගේ ස්වර්ගාරෝපණය

ස්වර්ගාරෝහණය යනු තමන්ගේ බලයෙන් ම ස්වර්ගය කරා ගමන් කිරීම යි. එසේ කළ හැකි වූයේ ජේසුස් වහන්සේට පමණිː ස්වර්ගයෙන් බැස වදාළ මනුෂ්‍ය පුත්‍රයාණන් හැර අන් කිසිවෙක් ස්වර්ගයට නොනැග්ගේ ය (ජොහන් 3:13). ස්වර්ගාරෝපණය යනුවෙන් අදහස් කරන්නේ තවත් කෙනෙකු විසින් ස්වර්ගයට ඔසවා ගැනීම යි. මරිය තුමිය ස්වර්ගාරෝහණය වූවා නොව ස්වර්ගාරෝපණය වූවා ය. එතුමිය ව ස්වර්ගයට ඔසොවා ගනු ලැබිණි. මේ පිළිබඳ ව කතෝලික සභා ධර්මෝපදේශය මෙසේ උගන්වයිː

ජන්ම පාපයේ සියලු කිළුටෙන් නිදෙස් ව ආරක්ෂා කරන ලද නිර්මල කන්‍යෝත්තමාවෝ මෙලෝ ජීවිත කාලය සම්පූර්ණ වූ කල ආත්ම ශරීර පිටින් ස්වර්ගීක මහිමයට ගෙන යනු ලැබ සියල්ලේ රජින ලෙස ජේසුස් වහන්සේ විසින් ස්ථාපිත කළ සේක. එමගින් එතුමිය පාපය හා මරණය ජයගත් තම පුත්‍රයාණන් වන සියල්ලේ අධිපතියාණන් වූ ජේසුස් වහන්සේට අනුරූප වූවා ය. භාග්‍යවත් කන්‍ය මරියෝත්තමාවන්ගේ ස්වර්ගාරෝපණය කරණ කොට ගෙන එතුමිය තම පුත්‍රයාණන්ගේ මහිමාන්විත උත්ථානයෙහි කොටස්කාරියක් වන අතර අනෙකුත් ක්‍රිස්තියානින්ගේ උත්ථානය පිළිබඳ පෙර නිමිත්තක් ද වේ.

(කතෝලික සභා ධර්මෝපදේශය 966)



23.1 රූපය - මරියතුමියගේ ස්වර්ගාරෝපණය

තව ද මරියෝත්තමාවන්ගේ මෙලොව ජීවිතය අවසානයේ දී දෙවියන් වහන්සේ ඕතොමන් ව ආත්ම ශරීර පිටින් ස්වර්ගයට ඔසවා ගත් සේක. ජේසුස් වහන්සේ ව මරණයෙන් උත්ථාන කරලීම මගින් දෙවියන් වහන්සේ සැමට ම පොරොන්දු වූ උත්ථානයෙහි ඕතොමන් පංගුකාර වූයේ ඒ ආකාරයෙනි. මේ අනුව මරියෝත්තමාවන්ගේ ස්වර්ගාරෝපණය ගැන විශ්වාසය ප්‍රකාශ කිරීමේ දී අප කරන්නේ අපේ ම උත්ථානය හා සදාතන ජීවිතය ගැන අපේ විශ්වාසය ප්‍රකාශ කිරීම ය. ජේසුස් වහන්සේ අපෝස්තුලුවරුන්ට දුන් පහත පොරොන්දුවෙන් එය පැහැදිලි යː

මා ගොස් ඔබට ස්ථානයක් සූදනම් කළ විට, මා සිටිනා තැන ඔබත් සිටින පිණිස ඔබ කැඳවාගෙන යාමට මම නැවත එන්නෙමි.
(ජොහන් 14:3)

තමා ආදරය කරන සියල්ලන් තමා සමීපයේ තබා ගැනීමට ජේසුස් වහන්සේ තුළ වූ දැඩි ආශාව උන්වහන්සේගේ උත්තම පූජක යාච්ඤාවෙන් ද මනාව පැහැදිලි වෙයිඃ

පියාණෙනි, මා සිටිනා තැන ඔවුනුත් සිටිනවාට මම කැමැත්තෙමි."
(ජොහන් 17:24)

මරිය තුමියට ස්වර්ගාරෝපණය වීමට හැකි වූයේ එතුමිය පාපයෙන් වැලකී යහපත් ජීවිතයක් ගත කළ බැවිනි. අපට ද එම වරප්‍රසාදය හිමි කර ගැනීම සඳහා අප ද පාපයෙන් වැළකී යහපත් ජීවිතයක් ගත කළ යුතු වෙමු. එවිට ක්‍රිස්තුන් වහන්සේගේ දෙවන ආගමනයේ දී මරිය තුමිය ලද එම වරප්‍රසාදය අපට ද හිමි වනු ඇත.

## මරිය තුමියගේ දර්ශනය වීම්

මරිය තුමිය ජපමාලය අතැති ව කිහිපවරක් දර්ශනය වී ඇත. මේ දර්ශනය වීම් සියල්ල අප වෙත ඉතා පැහැදිලි පණිවිඩ කිහිපයක් ගෙන එයිඃ

1. ඉතා දුෂ්කර කාලයක අප ජීවත් වන බව දෙවියන් වහන්සේ දන්නා බව
2. මේ දුෂ්කර සමයේ දී මරියෝත්තමාවන් ඕතොමන්ගේ මාතෘකා ප්‍රේමය විශේෂ ආකාරයකින් අප වෙත පෙන්වන බව

## පාතිමා නුවර දේව මාතාවන් දර්ශනය වීම



23.1 රූපය - දේව මාතාවන් පාතිමා නුවර දර්ශනය වීම

ක්‍රි.ව. 1917 මැයි මස 13වන දින සිට ඔක්තෝබර් මස 13වන දින දක්වා කාලය තුළ අවස්ථා ගණනාවක දි ප්‍රැන්සිස්කෝ, ජසින්තා හා ලුසී යන තිදෙනාට පෘතුගාලයේ පාතිමා නුවර දී දේව මාතාවන් දර්ශනය වූවා ය. ඕක් ගසක ආලෝක ධාරාවක් මැද ජපමාලය අතැති ව එතුමිය දර්ශනය වී ලෝකවාසි පව්කරුවන්ගේ සිත් හැරීම සඳහා ජපමාලය උච්චාරණය කරන්නැයි ඉල්ලා සිටියා ය.

## ලූර්දු නුවර දේව මාතාවන් දර්ශනය වීම



23.1 රූපය - දේව මාතාවන් ලූර්දු නුවර දර්ශනය වීම

ක්‍රි.ව. 1858 පෙබරවාරි මස 11වන දින ප්‍රංශයේ ලූර්දු නුවර බර්ණදෙත් දැරියට 18 වරක් දර්ශනය වී ජපමාල භක්තියෙහි උතුම්කම පෙන්වා දුන්නා ය.

## වේලක්කන්නි නුවර දේවමාතාවන් දර්ශනය වීම



23.4 රූපය - දේව මාතාවන් වේලක්කන්නි නුවර දී දර්ශනය වීම

ජේසුස් වහන්සේ වඩාගත් මරිය තුමිය කිරි වෙළඳාමේ යන පිරිමි දරුවකුට පොකුණක් අසල දර්ශනය වූයේ 16වන සියවසේ දී ය. එතුමිය එම දරුවාගෙන් කිරි ඉල්ලා සිටියේ අතේ සිටි දරුවාට පෙවීමට ය. එම ඉල්ලීම ඉටු කළ දරුවා කිරි විකුණන ස්ථානයට ගොස් සමාව ඉල්ලුවේ ප්‍රමාදය සහ කිරි අඩු නිසා ය. එහෙත් බඳුනේ කිරි අඩු නොවිණි. එබැවින් කිරි මිල දී ගත් තැනැත්තා ඒ දරුවා සමග පොකුණ ළඟට නැවත පැමිණි විට එතුමිය ඒ දෙදෙනාට ම නැවත දර්ශනය වූවා ය. පසු ව වේලක්කන්නි යන එම ග්‍රාමයේ නැවත දර්ශනය වූ අතර දරුවකුගේ කොරය ද සුව කළා ය.

### සඳසරණ නුවානය

අපගේ සහ අන් අයගේ ජීවිතයේ එදිනෙදා ලෞකික හා ලෝකෝත්තර අවශ්‍යතා සාර්ථක ව ඉටුකර ගැනීමට සහ ඒ තුළින් දේව ආදරය අත්දකීමට හැකි වනු සඳහා සඳසරණ නුවානයට බැතියෙන් සහභාගි විය යුතු වෙමු.

### ජපමාලය

ජපමාලය යන සිංහල වචනය ඉංග්‍රිසියෙන් "රෝසරි" ලෙස හැඳින්වේ. එය ලතින් භාෂාවේ "රොසාරියුම්" යන වචනයෙන් බිඳී එයි. "රොසාරියුම්" වචනයේ තේරුම් වන්නේ "රෝස මල් උයන" හෝ "රෝස මල් දම" යන්න යි. ජපමාලය ජේසුස් වහන්සේගේ සහ මරිය තුමියගේ ජීවිතයේ අභිරහස් සහ සුවිශේෂී අවස්ථා ගැන මෙනෙහි කරන යැදුමකි.

මෙය ප්‍රබල අවියක් වන බැවින් එය ළඟ තබා ගැනීම, වාහනවල ඉදිරිපස රැඳවීම හා මරණයේ දී දේහයේ දෑත්වල රඳවා තැබීම තුළින් ප්‍රබල ආරක්ෂාවක් අත්කර ගත හැකි ය.

මරිය තුමිය දර්ශනය වූ සැම අවස්ථාවක ම ඉල්ලා සිටියේ පව්කරුවන්ගේ සිත් හැරීම පිණිස ජපමාලය උච්චාරණය කරන ලෙස ය. අපි සැවොම පව්කරුවෝ වෙමු. එහෙයින් පළමු ව අපේ සිත් හැරීම සඳහාත් දෙවනු ව අන් අයගේ සිත් හැරීම සඳහාත් දිනපතා අපි ජපමාලය යැදිය යුතු වෙමු. සැම වසරක ම ජනවන්දනා වර්ෂය තුළ මරිය තුමියට ගෞරව පුද කිරීමට ශුද්ධ වූ සභා මාතාව මංගල්‍ය ගණනාවක් පවත්වන්නී යඃ

- ජනවාරි 01 ඃ පරිශුද්ධ දේවමාතාවන්ගේ මංගල්‍යය
- පෙබරවාරි 04 ඃ කානික්ක මංගල්‍යය
- මැයි 31 ඃ එළිසබෙත් තුමිය බැහැදැකීමේ මංගල්‍යය
- සැප්තැම්බර් 08 ඃ මරිය තුමියගේ උපන් මංගල්‍යය
- අගෝස්තු 15 ඃ මරිය තුමියගේ ස්වර්ගාරෝපණය වීමේ මංගල්‍යය
- දෙසැම්බර් 8 ඃ දේව මෑණියන්ගේ නිර්මල පිළිසිඳීමේ මංගල්‍යය

### මරිය තුමිය ශුද්ධ වූ සභාවේ මාතාව යි

ජේසුස් වහන්සේ කුරුස ගසේ දී සිය මෑණියන් වන මරිය තුමිය  තමන් වහන්සේට ප්‍රේම කළ ශ්‍රාවකයාට මෑණියන් කොට භාර දුන් සේක (ජොහන් 19ඃ25-27). ජේසුස් වහන්සේගේ ස්වර්ගාරෝහණය දක්වා ම අපෝස්තුලුවරුන් හා ජනතාව සමග සිටි මරිය තුමිය එයින් පසු ව ඔවුන් ව අත්නොහැර සැම දෙනා සමග එක්සිත් ව නොකඩවා යාච්ඤාවේ නිරත වූවා ය. (ක්‍රියා 1ඃ14). ක.ස.ධ 963ට අනුව මරිය තුමී ජේසුස් වහන්සේගේ මාතාව ද ශුද්ධ වූ සභාවේ මාතාව ද වන බව පැහැදිලිය. vi වන පාවුලු ශුද්ධෝත්තම පියතුමාගේ "මිස්ටෙරියුම් ෆිඩෙයි" හෙවත් විශ්වාසයේ අභිරහස නමැති විශ්ව ලේඛනයට අනුව ද එතුමිය ලෝකයේ විවිධ ස්ථානවල දර්ශනය වෙමින් කළ ප්‍රකාශ හා එදිනෙද ජීවිතයේ අප අත්දකින මැදිහත් පිහිට තුළින් ද මරිය තුමිය ශුද්ධ වූ සභාවේ මාතාවන් බව ස්ථිර ව ම තහවුරු වේ. විවිධ ස්ථානවල දී දර්ශනය වෙමින්, මැදහත් වෙමින්, ශුද්ධ වූ සභාවේ මාතාව ලෙස අද ද මරිය තුමිය අදෘෂ්‍යමාන ව අප සමග වැඩ සිටින්නී ය.

**ක්‍රියාකාරකම**

1. ස්වර්ගාරෝහණය හා ස්වර්ගාරෝපණය අතර වෙනස පැහැදිලි කරන්න.
2. මරිය තුමියගේ දර්ශනයවීම්වලින් ඔබට ලැබෙන පණිවිඩ **දෙකක්** ලියන්න.
3. මරිය බැතියේ දේව ධාර්මික පසුබිම කෙටියෙන් පහදන්න.



**ජීවිතයට බිඳක්**

***මරියෝත්තමාවන්ගේ මැදහත් පිහිට පතා දිනපතා ජපමාලය උච්චාරණය කරන්න.***